පුස්තකාල සංගම් හා ආයතන පිළිබඳ අන්තර්ජාතික සමුළුව

ඉෆ්ලා වෘත්තීය වාර්තා, නො. 89

# විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා පුස්තකාල ප්‍රවේශය පිරික්සුම් ලැයිස්තුව

**බර්ගිටා අර්වෝල් සහ ගයිඩා ස්කැට් නීල්සන්**

සිංහල පරිවර්තනය **හසිත කෝරළගේ සහ උපේක්ෂා කොඩිතුවක්කු**

� අයිතිය 2005 පුස්තකාල සංගම් හා ආයතන පිළිබඳ අන්තර්ජාතික සමුළු

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සදහා පුස්තකාල ප්‍රවේශය - පිරික්සුම්ලැයිස්තුව/බර්ගිටා අර්වෝල් සහ ගයිඩා ස්කැට් නීල්සන් හෝග්, ඉෆ්ලා මූලස්ථානය, 2005 .- 18P 30 cm .- ( ඉෆ්ලා වෘත්තීය වාර්තාව : 89 )

ISBN 9077897046

ISSN 01681931

# පටුන


**පෙරවදන**.........................................................................................................පි. 3

**භෞතික ප්‍රවේශය** ............................................................................................ පි. 4

**පුස්තකාලය අවට පරිශ්‍රය**..................................................................................... පි. 4

**පුස්තකාලය තුළට පිවිසීම** ...................................................................................පි. 5

**ද්‍රව්‍ය හා සේවා සඳහා ප්‍රවේශය** ............................................................................. පි. 6

-භෞතික අවකාශය ................................................................................. පි. 6

-සනීපාරක්ෂක පහසුකම් ............................................................................ පි. 6

-සංසරණ මේසය / කවුන්ටරය...................................................................... පි. 7

-විමර්ශන / තොරතුරු මේසය...................................................................... පි. 7

-ළමා අංශය ........................................................................................... පි. 7

-කියවීම්, ඇසීම් හා අනෙකුත් ඌනතා සහිත පුද්ගලයන් සඳහා වූ අංශය..................පි. 8

**මාධ්‍ය ආකෘති** ................................................................................................. පි. 9

**අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සුවිශේෂ මාධ්‍ය ආකෘති** ........................................ පි. 9

**පරිගණක** .......................................................................................................... පි. 9

**සේවා සහ සන්නිවේදනය** ................................................................................ පි. 10

**කාර්ය මණ්ඩලය පුහුණු කරන්නේ කෙසේද** ........................................................... පි. 10

**විශේෂ අවශ්‍යතා සහිත පාඨකයන් සඳහා වන විශේෂ සේවා** ..................................... පි. 11

**විශේෂ අවශ්‍යතා සහිත පාඨකයින් සඳහා තොරතුරු ලබා දෙන්නේ කෙසේද** ........................ පි. 11

-දෘශ්‍යාබාධිත පුද්ගලයන් ........................................................................... පි. 11

-බිහිරි හෝ ශ්‍රවණාබාධිත පුද්ගලයන් ............................................................. පි. 11

-කියවීමේ අපහසුතා සහිත පුද්ගලයන්.............................................................. පි. 12

-ශාරීරික ආබාධ සහිත පුද්ගලයන් ................................................................. පි. 12

-මානසික ආබාධ සහිත පුද්ගලයන්................................................................. පි. 12

-අවබෝධ කර ගැනීමේ පහසුව සඳහා තොරතුරු සකසන්නේ කෙසේද...................... පි. 13

-වෙබ් අඩවිය ........................................................................................... පි. 14

**විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වන සංවිධාන හා පුද්ගලයන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන්නේ කෙසේද** ....................................................... පි. 15

**වැඩිදුර මූලාශ්‍ර** ............................................................................................ පි.16

# පෙරවදන

## සියලු පුස්තකාල සඳහා සැමට ප්‍රවේශය.

ලොව පුරා විසිරී ඇති බොහෝ රටවල් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හට පුස්තකාල භාවිතය පිළිබඳ ප්‍රවේශය මෙතෙක් සකසා හෝ සැකසීම අපේක්ෂා කර නොමැත. සියලු පුස්තකාල භාවිත කරන්නන් සඳහා සමාන අවස්ථා සැපයීමට නම් මෙම පාඨක කණ්ඩායම් දැසින් පුස්තකාල ගොඩනැගිලි වල භෞතික තත්වය මෙන්ම පුස්තකාල සේවා හා වැඩසටහන් දෙස අනිවාර්යෙන්ම බැලිය යුතුය.

Standing Committee of Libraries Serving Disadvantaged Persons (LSDP) අවවරප්‍රසාදිත පුද්ගලයින් සඳහා වන ස්ථාවර කමිටුව මගින් ගොඩ නගන ලද මෙම පිරික්සුම් ලැයිස්තුව සියලු වර්ගයේ පුස්තකාල සඳහා (මහජන අධ්‍යයන, පාසල්, විශේෂ) ප්‍රායෝගික මෙවලමක් ලෙස නිර්මාණය කර ඇත්තේ 1) ගොඩනැගිලි සේවා, ද්‍රව්‍ය හා වැඩසටහන් සඳහා ප්‍රවේශ වීමට පවතින ස්තර තක්සේරු කිරීමට හා 2) අවශ්‍යතාව පවතින ස්ථාන සඳහා ප්‍රවේශ වීම් වැඩි දියුණු කිරීමට ය. පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවේශ අවශ්‍යතා මෙම ලියවිල්ලේ අරමුණට පරිබාහිර වේ.

පුස්තකාලයකයකට ප්‍රවේශ වීම සැකසීමට ඔබට ආර්ථික සම්පත් අවශ්‍ය වේ. කෙසේ වුවද බොහෝ වැඩි දියුණු කිරීම්, ඉතා අවම මූල්‍ය ප්‍රමාණයක් යටතේ හෝ කිසිදු මූල්‍ය වියදමකින් තොරව ස්ථාපනය කළ හැක. කාර්ය මණ්ඩලයේ ආකල්ප වෙනස් කිරීමකින් හෝ නවතාවයකින් යුක්තව සිතීමෙන් මේ සඳහා විසඳුමක් ලබා ගැනීමේ හැකියාව පවතී.

තක්සේරු ක්‍රියාවලියේ දී විශේෂ අවශ්‍යතා සහිත කණ්ඩායම් නියෝජනය කරන්නන් හා සහය සංවිධානය අන්තර්ගත කිරීම, අප විසින් නිර්දේශ කරනු ලබයි. මෙම තනි පුද්ගල ආදාන, පිරික්සුම් ලැයිස්තු හඳුනාගැනීම් සමග එක් කිරීමෙන් කඩිනම් ව්‍යාප්ත මිණුම් හා අනාගත සැලසුම් සඳහා වඩාත් ඵලදායි තොරතුරු ලබා දෙනු ඇත.

ලොව පුරා පුස්තකාල හා ගොඩනැගිලි බෙහෙවින් විවිධත්වයෙන් යුක්ත බැවින් සංඛ්‍යාත්මක මිණුම් මෙම පිරික්සුම් ලැයිස්තුවේ අන්තර්ගත නොවේ. සෑම රටකම පවතින නීති හා රෙගුලාසි පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් ආදේශ කිරීම හෝ අවාසි සහගත පාඨකයන් සමග පරික්ෂා කොට බැලීම අප විසින් නිර්දේශ කරනු ලබයි.

වෙනස් වීම් බොහෝ විට සිදුවන්නේ සෙමිනි* එහෙත් ප්‍රධාන වන්නේ වඩාත් වැදගත් ගැටලුව කෙරෙහි දැන් අවධානය යොමු කිරීමයි: ආබාධ සහිත බව මාර්ගෝපදේශ මූලධර්මය ලෙස නොසලකා පවතින ගොඩනැගිලි හා සේවා තක්සේරු කිරීම හෝ නව ඒවා සැලසුම් කිරීම තුළින් සියලු පුද්ගලයන් සඳහා සමාන ප්‍රවේශවීම් සැලසීමයි. ඔබේ වගකීම ආබාධ සහිත පුද්ගලයන්ට පුස්තකාලයට ආරාධනය කිරීම බව සිහිතබා ගත යුතුය.

## භෞතික ප්‍රවේශය

රටක පුස්තකාල සැමට පරිහරණය කිරීමේ හැකියාව තිබිය යුතුය. විවිධාකාර ආබාධ සහිත පුද්ගලයන්ට පුස්තකාල වටපිටාව, ඇතුල්වන ස්ථානය, විවේකාගාර, පියගැටපෙළ, සෝපාන හා විශේෂ කාමර කරා ප්‍රවේශ වීමට හැකියාව තිබිය යුතුය. රෝදපුටුවක ගමන් ගන්නා පුද්ගලයකුට සියලු අංශ කරා ගමන් කළ හැකි විය යුතු අතර දෘශ්‍යාබාධිත පුද්ගලයෙකුට බාධකවලට මුහුණ නොපා ඔහුගේ / ඇයගේ සැරයටිය ආධාරයෙන් හෝ නියමු සුනඛයා සමග ගමන් කළ හැකි විය යුතුය. ශ්‍රවණාබාධිත පුද්ගලයකුට පුස්තකාල කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදනය කිරීමට හැකියාව තිබිය යුතුය. බුද්ධිමය දුර්වලතාවයකින් යුත් පුද්ගලයකුට පහසුවෙන් පොත් හා අනෙකුත් ද්‍රව්‍ය සොයාගත හැකි විය යුතුය. ඩයිලෙක්ෂියා හෝ වෙනත් කියවීමේ අපහසුතා ඇත්තෙකුට ඔහුගේ / ඇයගේ වටපිටාව හඳුනාගැනීමට හැකියාව තිබිය යුතුය.

### පුස්තකාලය අවට පරිශ්‍රය

ආබාධ සහිත පුද්ගලයන්ට ස්ථානයට පැමිණීමට, පුස්තකාල ගොඩනැගිල්ලට ප්‍රවේශ වීමට ආරක්ෂිතව හා පහසුවෙන් ගොඩනැගිල්ලට ඇතුල් වීමට හැකියාව තිබිය යුතුය. ප්‍රධාන ඇතුළුවීමේ දොරටුව ප්‍රවේශ වීම සඳහා සකසා දිය නොහැකි නම් ස්වයංක්‍රීය දොරටු විවරකයක්, බෑවුමක් හා දුරකථනයක් යන උපකරණවලින් සමන්විත දෙවන ප්‍රවේශන ඇතුළු වීමක් සපයා දිය යුතුය.

- ආබාධ සහිත වූවන් සඳහා වන ජාත්‍යන්තර සංකේතය ලකුණු කළ ප්‍රමාණවත් රථගාල් පහසුකම්
- පුස්තකාල ඇතුල්වීමේ දොරටුවට ආසන්න වාහන නවතා තැබීමේ පහසුකම්
- පහසුවෙන් හා ක්ෂණිකව කියවිය හැකි සංඥා පුවරු
- ඇතුල්වීමේ දොරටුව කරා බාධක රහිත හා මනා ආලෝකකරණයෙන් යුත් ප්‍රවේශ මාර්ග
- ඇතුල්වීම් අසල සැහැල්ලු හා ලිස්සන සුලු නොවන මතුපිට
- අවශ්‍ය නම් පියගැට පෙළ අසලින් ම අත්වැට සහිත ලිස්සන සුලු නොවන වඩාත් ගැඹුරු නැති බෑවුම
- දෙපසින් ම අත්වැට සහිත බෑවුම
- ශ්‍රවණාබාධිත පාඨකයන් සඳහා ප්‍රවේශ සපයන ඇතුළුවීම් දුරකථනය

## පුස්තකාලය තුළට පිවිසීම

රෝද පුටුවක හෝ කිහිලිකරු හෝ ආධාරයෙන් ගමන් කරන්නෙකුට දොරෙන් ඇතුළු වීමටත් ආරක්ෂිත මුර පොලවල් පසුකර යාමටත් හැකියාව තිබිය යුතුය. සැරයටියක් හෝ නියමු සුනඛයන් ආධාරයෙන් ගමන් ගන්නා දෘශ්‍යාබාධිත පුද්ගලයකුට බාධාවලට මුහුණ නොපා ඇතුළුවීමට හැකියාව තිබිය යුතුය.

- රෝද පුටුව වෙනතකට හැරවීම සඳහා දොරටුව ඉදිරිපස ප්‍රමාණවත් පරිදි ඉඩ පහසුකම
- රෝද පුටුවකින් පිවිසීමට හැකියාව සහිත පුළුල් ඇතුළුවීමේ දොරටුව
- රෝද පුටුවක සිටින පුද්ගලයකුට ළඟා විය හැකි ස්වංක්‍රීය දොරටු විවරකය
- ක්ෂණික ව රෝදපුටුවෙන් ප්‍රවේශ වීමට පඩිපෙළ රහිත දොරටු
- දෘශ්‍ය ආබාධවලින් පෙළෙන්නන් හට අනතුරු හැඟවීමට ලකුණු කළ වීදුරු දොරටු
- රෝද පුටුව / ආධාරකය හෝ වෙනත් සංචලතා ආධාරක ගමන් කිරීමේ හැකියාව ඇති ආරක්ෂක මුර කුටි
- වර්ණසංකලනය කළ පියගැටපෙළ හා පඩි
- සෝපාන වෙත දිවෙන රූපසටහන්
- බ්‍රේල් හා කෘතීම කථන බොත්තම් හා සංඥාවලින් යුත් මනා ආලෝකකරණය කළ සෝපාන
- රෝද පුටුවෙන් ළඟාවිය හැකි සෝපාන බොත්තම්

## ද්‍රව්‍ය හා සේවා වෙත පිවිසීම

පුස්තකාලයේ සියලු අංශ වෙත ප්‍රවේශ වීමේ හැකියාව තිබිය යුතුය. පැහැදිලි සංඥා සහිතව අවකාශය තර්කානුකුලව සකසා තිබිය යුතු අතර ඇතුල් වීම ආසන්නයේ බිම් සැලැස්ම ඉදිරිපත් කර තිබිය යුතුය. සමස්ත පුස්තකාලය ඇතුළත රෝද පුටුව එහා මෙහා හැසිරිවිය හැකි විය යුතුය. පුස්තකාලයේ එක් මහලක් වඩා පවතී නම් නම් රෝද පුටු සඳහා සෝපානයක් හෝ බෑවුමක් තිබිය යුතුවේ. සියලු ද්වාර සඳහා ස්වයංක්‍රීය විවරක තිබිය යුතු අතර දොරටුව පඩිවලින් තොර විය යුතුය. රෝද පුටුවකින් ළඟා විය හැකි මට්ටමකට පොත් රාක්ක ඉතා මැනවින් තිබිය යුතු ය. රෝද පුටු භාවිතා කරන පුද්ගලයන් සඳහා සැලකිය යුතු ප්‍රමාණයකට මේස සහ පරිගණක වැඩකරන ස්ථාන වල අනුවර්තනය කළ යුතුය. ආබාධ සහිත පුද්ගලයන් සඳහා අඩුම තරමින් එක් වැසිකිළියක් හෝ වෙන් කළ යුතු වේ.

### භෞතික අවකාශය

- රූප සටහන් සහිතව පැහැදී, හා පහසුවෙන් කියවිය හැකි සංඥා
- රෝද පුටුවකින් ළඟාවියහැකි රාක්ක
- පුස්තකා,ය පුරා විවිධ උස මට්ටම්වලින් යුත් කියවීම් හා පරිසණක මේස
- ශක්තිමත් අත්වාරු සහිත පුටු
- පොත් රාක්ක අතර බාධා රහිත අන්තරා,
- දෘශ්‍ය හා ශ්‍රවණ ගිනි අනතුරු සංඥා
- හදිසි අවස්ථාවකදී පාඨකයින් හට සහාය දිය හැකි ,ෙස පුහුණු කළ කාර්ය මණ්ඩ,ය

### සනීපාරක්ෂක පහසුකම්

ආබාධ සහිත පුද්ගලයන් සඳහා පහත සඳහන් උපාංග සහිතව අවම වශයෙන් එක් වැසිකිලියක් වත් තිබිය යුතුය.

- වැසිකිළිය පිහිටි ස්ථානය දක්වන රූප සටහන් සහිත පැහැදිලි සංඥා
- රෝද පුටුවකින් ඇතුළු වීම සඳහා පුළුල් දොර හා රෝද පුටුව වෙනතකට හැරවීමට ප්‍රමාණවත් අවකාශය
- වැසිකිළි අසුන වෙත රෝද පුටුව ඉහළට එස වීමට හැකිවන පරිදි කාමර ඉඩපතරය
- රෝද පුටු වල ගමන් ගන්නා පුද්ගලයන්ට අත්වාරු සහිත හා පිරිසිදු කරන ලීවරයට ළඟාවිය හැකි මට්ටමින් පවතින වැසිකිළි

- රෝද පුටු භාවිතා කරන පුද්ගලයන්ට ළඟා විය හැකි අනතුරු සංඥා බොත්තම
- සුදුසු උසක ස්ථානගත කළ සෝදන බේසම් / නාන බේසම් හා කණ්නාඩි

**සංසරණ මේසය**

- සකස් කළ හැකි මේසය
- ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා ලූප පද්ධති ප්‍රේරණය
- වැඩිහිටි හා  ආබාධිත පාඨකයන් සඳහා පුටු
- ප්‍රවේශ විය හැකි ස්වයං සේවා සංසරණ ස්ථාන

**විමර්ශන / තොරතුරු මේසය**

- සකස් කළ හැකි මේසය
- රැඳී සිටින ස්ථානයේ පෝලිම් ක්‍රමවේදයක් සකස්කිරීම
- වැඩිහිටි හා ආබාධ සහිත පාඨකයන් සඳහා සුදුසු පුටු
- ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා ලූප පද්ධති ප්‍රේරණය

**ළමා අංශය**

- ළමා අංශය වෙත දිවෙන පැහැදිලි පින්තූර සටහන් සහිත සංඥා
- ළමා අංශය කරා දිවෙන  වර්ණිත ස්පර්ශ රේඛාව  (පෙනුම සඳහා කහ වර්ණය )
- රාක්ක  අතර බාධා රහිත අන්තරාල
- කථන පොත් සහ වෙනත් විශේෂ මාධ්‍ය පැවතීම
- ආබාධ සහිත දරුවන් සඳහා ප්‍රවේශ විය හැකි පරිගණක
- රෝද පුටුවකින් ප්‍රවේශ විය හැකි මට්ටමේ රාක්ක හා පින්තූර පොත් බහාලුම්

## කියවීම් ශ්‍රවණ හා වෙනත් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන්වූ අංශය

කියවීම් ආබාධ සහිත පාඨකයන් පුස්තකාල වෙත පිවිසීමේ දී විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. විවිධ ආබාධ සම්බන්ධව හා මෙම ආබාධ සහිත පාඨකයින් හට උපකාර කරන ආකාරය පිළිබඳව පුස්තකාල කාර්ය මණ්ඩලය දැනුවත් විය යුතුය. කියවීම් ආබාධ සහිත පුද්ගලයන් සඳහා ම විශේෂයෙන් නිපදවූ ද්‍රව්‍ය සොයා ගැනීමට පහසු විය යුතුය. මෙම ද්‍රව්‍ය අතර කථන ග්‍රන්ථ පහසුවෙන් කියවිය හැකි පොත්, බ්‍රේල් ග්‍රන්ථ හා විශාල අකුරු මුද්‍රිත පොත් අන්තර්ගත විය හැකි අතර මේවා සමහරක් රටවල වාණිජව නිෂ්පාදනය කෙරෙන අතර අනෙකුත් රටවල දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා වන පුස්තකාල වලින් නිකුත් කරනු ලබයි.

- කථන ග්‍රන්ථ හා කථන ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන්වූ වෙනත් ද්‍රව්‍ය සහිත මධ්‍යගතව ස්ථානගත වූ අංශය
- විශේෂ අංශය කරා දිවෙන වර්ණිත (දෘශ්‍යතාව සඳහා කහ) ස්පර්ශ රේඛාව
- පැහැදිලි සංඥා/ සංකේත
- දීප්තිමත් කියවීම් එළි සහිත සැපපහසු ආසන පැනවූ ප්‍රදේශය
- ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව අනුපූරක කිරීම සඳහා ටේප් රිකෝඩරයක්, සංයුක්ත තැටි වාදකය, DAISY (Digital Audio Information system) ඩිජිටල් ශ්‍රවණ තොරතුරු පද්ධතිය) වාදකය 1 ) හා වෙනත් උපකරණ
- විශාලක කාචය, ආලෝකවත් විශාලනය, විද්‍යුත් කියවනය හෝ සංවෘත පරිපථ රූපවාහිනිය (CCTV)
- කියවීම් හා සංජානනීය ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් නිර්මාණය වූ තිර ඇඩප්ටර හා මෘදුකාංග සහිත පරිගණක 1) DAISY යනු පුස්තකාල විසින් දෘශ්‍ය ආබාධිතයන් සඳහා භාවිතා කරන ඩිජිටල් කථන ග්‍රන්ථ පද්ධතියකි.

# මාධ්‍ය ආකෘති

සියලු පුස්තකාල ද්‍රව්‍ය වෙත සියලු පාඨකයන්ට ඉතා මැනවින් ප්‍රවේශ වීමට හැකියාව තිබිය යුතුය. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ ක්‍රම පවතී. පුස්තකාලය මගින් කථන ග්‍රන්ථ, සංඥා භාෂා උප ශීර්ෂ සහිත හෝ රහිත වීඩියෝ හෝ වීඩියෝ ඩිජිටල් තැටි ග්‍රන්ථ, බ්‍රේල් ග්‍රන්ථ, ප්‍රවේශ විය හැකි විද්‍යුත් ග්‍රන්ථ, පහසුවෙන් කියවිය හැකි පොත් හෝ වෙනත් මුද්‍රිත නොවන ද්‍රව්‍ය අත්පත් කරගත යුතුය. දෘශ්‍යාබාධිතයන් සඳහා වන ජාතික පුස්තකාලය ඇතුළු වෙනත් පුස්තකාලවලින් මෙම ද්‍රව්‍ය බැහැරට ලබා ගැනීම පිළිබඳව පුස්තකාල කාර්ය මණ්ඩලය දැන සිටිය යුතුය. ආබාධ සහිත පුද්ගලයන් සඳහා වැදගත් වන ද්‍රව්‍ය ආකෘති පහත ලැයිස්තු ගත කොට ඇත.

## ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන විශේෂ මාධ්‍ය ආකෘති

- කථන පොත්, කථන පුවත්පත් හා කථන වාර සඟරා
- විශාල අකුරු මුද්‍රිත පොත්
- පහසුවෙන් කියවිය හැකි පොත්
- බ්‍රේල් පොත්
- සංඥා භාෂා උප ශීර්ෂ සහිත හෝ රහිත වීඩියෝ / ඩිජිටල් වීඩියෝ තැටි ග්‍රන්ථ
- විද්‍යුත් ග්‍රන්ථ
- ස්පර්ශක පින්තූර පොත්

## පරිගණක

පොදු ජනයාගේ භාවිතය සඳහා වන පරිගණක කරා ප්‍රවේශ විය හැකි විය යුතුය. පරිගණක හා අනුවර්තන උපාංග ද්විත්වය සඳහා ම වේගවත් හා විශ්වාසදායී තාක්ෂණික සහය අවශ්‍ය වේ. කාර්ය මණ්ඩලය වැඩ කරන ස්ථානයේ දී සහාය ලබා ගැනීම පිණිස පුහුණු කළ යුතුය. පරිගණක ප්‍රවේශගත කරන්නේ කෙසේද කෙසේද යන්න පිළිබඳව ජාතික හා දේශීය ආබාධිත උපදේශන හා සහය සංවිධානවලට තොරතුරු ලබාදිය හැක. පහත වෙබ් අඩවිවල ද පුළුල් තොරතුරු දක්වා ඇත. http://www.w3c.org/wai , http://bobby.watchfire.com

- නම්කර ඇති පරිගණක workstation රෝද පුටු පාඨකයින් සඳහා ආදේශ කිරීම
- ශරීරාබාධ ඇත්තන් සඳහා ආදේශ යතුරු පුවරු හෝ ආවරණය කළ යතුරු පුවරු
- නම් කරන ලද පරිගණක තිර කියැවීමේ වැඩසටහන්, විශාලන හා කෘතීම කථන උපකරණවලින් යුක්ත වීම

- නම් කරන ලද පරිගණක ඩිස්ලෙක්ඩියා වලින් පෙළෙන්නන් සඳහා සුදුසු ලෙස අක්ෂර වින්‍යාසය හා වෙනත් උපදේශක මෘදුකාංගවලින් යුක්ත වීම

- පරිගණක සඳහා තාක්ෂණික සහය (හැකි නම් ක්ෂේත්‍රයේදී ම ලබාදීම)

- පරිගණක භාවිතය පිළිබඳ පාඨකයන් දැනුවත් කිරීමට හැකියාව ඇති කාර්යය මණ්ඩලය

## සේවා හා සන්නිවේදනය

ආබාධ සහිත පුද්ගලයන්ට පුස්තකාලය ප්‍රවේශගත කිරීම තුළ මෙම පරිශීලක කණ්ඩායම්වල අවශ්‍යතා පූරණය සඳහා සේවා හා වැඩසටහන් සැපයීමේ ඉඩ ප්‍රස්තාව අන්තර්ගත වේ. පුස්තකාල කාර්ය මණ්ඩලය හා පාඨකයින් අතර සන්නිවේදනය පැහැදිලි හා සංවේදී විය යුතුය. සියලු පාඨකයන් තුළ සුහදශීලී පිළිගැනීමක් දැන වැදගත් වන්නේ ඔවුන් නැවත පැමිණීමට එමගින් රුචි වන බැවිනි. ආබාධ සහිත පුද්ගලයන්ට ශාරීරික බාධා පමණක් නොව පුස්තකාලයට පැමිණීමට හා ඔවුන්ගේ අවශ්‍යතා සන්නිවේදනය කිරීමට මානසික අවහිරතා ද පවතින බව පුස්තකාල කාර්යය මණ්ඩලය සිහිතබා ගත යුතුය.

## කාර්ය මණ්ඩලය පුහුණු කරන්නේ කෙසේද?

පුස්තකාලයට ප්‍රවේශවීම මනාව නිර්වචනය කළ කළමණාකරණ වගකීමක් විය යුතු වේ. නම් කළ කාර්ය මණ්ඩල සාමාජිකයෙක් ආබාධ සහිත කණ්ඩායම් හා සහය සංවිධාන සමග සම්බන්ධ පුද්ගලයෙක් ලෙස ක්‍රියා කළ යුතුය. කෙසේ වුවද ආබාධයන් හි විවිධාකාර හා පාඨකයාට වඩාත් හොඳින් සහය විය හැකි ආකාරය පිළිබඳව සමස්ත කාර්ය මණ්ඩලය දැනුවත් විය යුතුය. කාර්ය මණ්ඩලය භාරකරුවෙකු හරහා නොව ඍජුව පාඨකයා සමග සන්නිවේදනය කළ යුතුය. කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ සුදුසු උදාහරණ වන්නේ :

- පුස්තකාල පාඨකයින් ලෙස තම අවශ්‍යතා පිළිබඳ කතිකා කිරීමට ආබාධ සහිත පුද්ගලයන් හට කාර්ය මණ්ඩල රැස්වීම්වලට ආරාධනා කිරීම.
- විශේෂිත ආබාධ සහිත කණ්ඩායම් සඳහා නිශ්චිත පදනමක් යටතේ පුස්තකාලය සපයන සේවා පිළිබඳ කාර්ය මණ්ඩලය වෙත විද්‍යුත් තාපැල හා / හෝ වෙනත් තොරතුරු මගින් බෙදා හැරීම.
- විශේෂිත පාඨක කණ්ඩායම් වෙත සපයන සේවා පිළිබඳ තොරතුරු නව කාර්යය මණ්ඩලයට හඳුන්වා දීමේ වැඩසටහන් මාලාවේ අන්තර්ගත කිරීම

## ආබාධ සහිත පුද්ගලයන් සඳහා විශේෂ සේවා

- පුස්තකාලයට පැමිණිය නොහැකි පුද්ගලයන් සඳහා නිවෙස් වෙත බෙදා හැරීමේ සේවා
- සුබසාධන පහසුකම් හා ආයතනවල සිටින පුද්ගලයන් වෙත ව්‍යාප්ති සේවා
- කියවීමේ අපහසුතා සහිත පාඨකයින් හට කියවීමේ සේවා (කෙටි වචන ලිපි, උපදෙස්, ටේප් හෝ සංයුක්ත තැටිගත ලේඛන) හෝ තිර කියවනයක් සහිත පරිගණකයක් මත ප්‍රවේශ වීම සඳහා ස්කෑන් කරන ලද පෙළ
- කියවීම් ආබාධ සහිත පුද්ගලයන් සඳහා නිරන්තරයෙන් සංවිධානය කළ උපදේශන සේවා

## ආබාධ සහිත පුද්ගලයන් සඳහා තොරතුරු ලබාදීම

පුස්තකාලය මඟින් විශේෂ අවශ්‍යතා සහිත තනි පුද්ගලයන් හා කණ්ඩායම් දෙවර්ගය සඳහා ම පුස්තකාලය පිළිබඳ නියමු චාරිකා ලබා දිය යුතුය. මෙම පාඨකයින් බොහොමයක් සතුව පුස්තකාලය පිළිබඳ තොරතුරු කියවා ගැනීමේ ගැටලු පැවතිය හැක. පුස්තකාලය වෙත ප්‍රවේශ වීම, සේවා, ද්‍රව්‍ය හා වැඩසටහන් පිළිබඳ තොරතුරු  පහත ලැයිස්තුගත කර ඇති ආදේශන ආකෘති යටතේ පැවතිය යුතුය. (ඔබ රටෙහි ආබාධ සහිත පුද්ගලයන් පොදුවේ භාවිතා කරන ශ්‍රව්‍ය ආකෘති තෝරා ගන්න)

**දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා**

- විශාල ලෙස මුද්‍රිත තොරතුරු
- ශ්‍රව්‍ය ටේප්,  සංයුක්ත තැටි,  ඩිජිටල් වීඩියෝ තැටි, DAISY ආකෘති මත තොරතුරු
- බ්‍රේල් තොරතුරු
- පුස්තකාල ප්‍රවේශගත වෙබ් අඩවියේ තොරතුරු

**බිහිරි හෝ ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා**

- උප ශීර්ෂ සහිත / හෝ සංඥා භාෂා වීඩියෝගත තොරතුරු
- කෙටි දුරකතන හා /හෝ විද්‍යුත් තැපැල හරහා තොරතුරු
- පුස්තකාල ප්‍රවේශගත වෙබ් අඩවිය පිළිබඳ තොරතුරු (ශ්‍රව්‍ය තොරතුරු පෙළ ලෙස ද දක්වා තිබිය යුතුය)
- භාෂා කුසලතා හඳුනා ගැනීමට පෙර බිහිරි වූ හෝ උපතින්ම බිහිරි පාඨකයින් සඳහා පහසුවෙන් කියවිය හැකි පාඨ

**කියවීම් අපහසුතා සහිත පුද්ගලයන් සඳහා (කියවීමේ දුර්වල පාඨකයන් හෝ ඩිස්ලෙක්ඩියා සහිත පුද්ගලයන්)**

- පහසුවෙන් කියවිය හැකි ලෙස පෙළවලින් රචිත තොරතුරු
- ශ්‍රව්‍ය / වීඩියෝ ටේප්, සංයුක්ත තැටි, ඩිජිටල් වීඩියෝ තැටි හෝ / හා DAISY ආකෘතිගත තොරතුරු
- පුස්තකාල ප්‍රවේශගත වෙබ් අඩවියේ ඇති තොරතුරු

**කායික අපහසුතා ඇති පුද්ගලයන් සඳහා**

- ශ්‍රව්‍ය / වීඩියෝ ටේප් හෝ සංයුක්ත තැටි / ඩිජිටල් වීඩියෝ තැටි හෝ DAISY ආකෘතිගත තොරතුරු
- පුස්තකාල ප්‍රවේශගත වෙබ් අඩවියේ ඇති තොරතුරු

**මානසික ආබාධ සහිත පුද්ගලයන් සඳහා**

- පහසුවෙන් කියවිය හැකි ආකෘතිගත තොරතුරු
- ශ්‍රව්‍ය / වීඩියෝ ටේප් හෝ සංයුක්ත තැටි / ඩිජිටල් වීඩියෝ තැටි හෝ DAISY ආකෘතිගත තොරතුරු
- පුස්තකාල ප්‍රවේශගත වෙබ් අඩවියේ ඇති තොරතුරු

**ආබාධ සහිත පාඨකයන් වෙත තොරතුරු : අවශ්‍ය මාධ්‍ය ආකෘති.**

| ආබාධ සහිත පුද්ගල කාණ්ඩ | විශාල මුද්‍රණ | ටේප් / DAISY ආකෘතිගත සංයුක්ත තැටි ඩිජිටල් වීඩියෝ තැටි | බ්‍රේල් | වෙබ් අඩවි | සංඥා භාෂා උප ශීර්ෂ සහිත/ රහිත වීඩියෝ | කථන දුරකථන | පහසුවෙන් කියවිය හැකි |
|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍යාබාධිත | X | X | X | X | | | |
| බිහිරි හා ශ්‍රවණාබාධිත | | | | X | X | X | X |
| කියවීම් අපහසුතා සහිත | X | X | | X | | | X |
| ශාරීරික අපහසුතා | | X | | X | | | |
| මානසික ආබාධ සහිත | | X | | X | | | X |

**තොරතුරු පහසුවෙන් අවබෝධ කර ගැනීම සිදු කරන්නේ කෙසේද?**

- තොරතුරුමය ද්‍රව්‍ය සියලුම පාඨකයන් හට අවබෝධ විය යුතුය. මුද්‍රිත හා වෙබ් අඩවිගත තොරතුරු ද්විත්වය සඳහා ම පහත මාර්ගෝපදේශ ආදේශ වේ.
- පැහැදිලි හා සරල කෙටි වාක්‍ය ලියන්න
- විදේශ වචන භාවිතයෙන් වළකින්න
- පරිච්ඡේද හා පෙළ කොටස් අතර විශාල සුදු ඉඩක් ඇතුළත් කරන්න
- පෙළ සමඟ එකම පිටුවේම රූප සටහන් අන්තර්ගත කරන්න
- සුදු හෝ ලා වර්ණ පසුබිමට තද පැහැති අකුරු භාවිතා කරන්න. * තද වර්ණක පසුබිමක ලා පැහැති අකුරු කිසිවිට නොයොදන්න
- කියවීම් පහසු ද්‍රව්‍ය සඳහා ඉෆ්ලා මාර්ගෝපදේශ ද බලන්න

# වෙබ් අඩවි

කියවීම් අපහසුතා සහිත පුද්ගලයන් හට කෘත්‍රිම කථන හා බ්‍රේල් ප්‍රදර්ශක එක්කළ විශාලන පහසුකම හා තිර කියවන හරහා පුස්තකාල වෙබ් අඩවිය හා සුචිය වෙත පූර්ණව ප්‍රවේශගත වීම සැලසිය යුතුය. දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය අන්තර්ගතය සඳහා පැහැදිලි හා තර්කානුකූල නිර්මාණ සහිත ලිඛිත පැහැදිලි කිරීම් භාවිතා කරන්න. වර්ණ භාවිතයෙන් තොරව පෙළ හා පසුතලය හඳුනා ගැනීමට හැකිවන පරිදි වගබලා ගන්න.

ප්‍රවේශගත වෙබ් අඩවි පිළිබඳ තොරතුරු at Web Accessibility Initiative of the World Wide Web Consortium http://www.w3c.org/wai and Watchfire WebXact http://webxact.watchfire.comc වලින් හමු වේ. දෘශ්‍යාබාධ පුද්ගලයන් සඳහා වන ඔබගේ ජාතික පුස්තකාලයෙන් ද විමසා බැලිය හැක.

- නිර්මාණය තර්කානුකූල හා පහසුවෙන් ගවේශණය කළ හැකි ලෙස සකසන්න
- ළමා වෙබ් අඩවිය ප්‍රවේශගත විය හැකි පරිදි සකසන්න
- පෙළ විශාලනය, අකුරු වෙනස් කිරීම හා රේඛාවල දිග හා පේළි අතර ඉඩ ආදිය වෙනස් කිරීමට මෘදුකාංග සපයන්න
- pdf හා doc සඳහා ආදේශක ආකෘති ලබා දෙන්න -- ආකෘතිකරණය නොකළ පෙළ txt වඩාත් සුදුසු ය
- අන්තර්ගතය නිර්මාණයෙන් වෙන් කරන්න. -- ඉදිරිපත් කිරීම හා පිරිසැලසුම සඳහා මග පෙන්වීමට මෝස්තරපත්‍ර භාවිතා කරන්න
- වෙබ් අඩවියේ සෙවුම් පහසුව යොදන්න
- රාමු හා වගු යෙදීමෙන් වලකින්න
- චලන රූප හා පෙළ යෙදීමෙන් වලකින්න
- පෙළ සඳහා සාපේක්ෂ මිණුම් භාවිතා කරන්න
- පෙළ සමග ශ්‍රව්‍ය උපකරණ ලබා දෙන්න

## ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ආයතන හා පුද්ගලයන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන්නේ කෙසේද?

පුස්තකාල සේවා හා වැඩසටහන් සඳහා විශ්වාසනීයත්වය ගොඩනැංවීමට හා සියලු පුරවැසියන් වෙත ළඟාවීමට ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ආයතන හා පුද්ගලයන් නියෝජනය නරන්නන් සමඟ සහයෝගීතාවය ගොඩනගා ගත යුතුය. එවන් ව්‍යාප්ති සේවා ප්‍රයත්නයන්හි අන්තර්ගත විය හැක්කේ

- විවිධ ව්‍යාපෘති සහයෝගිතාවය සඳහා විධිමත් ආරාධනාවක්
- ඒකාබද්ධ බුද්ධි කලම්බන රැස්වීම්
- පුස්තකාලයේ සංවිධානාත්මක ක්‍රියාකාරකම් අතර,
    - ආබාධ පිළිබඳ පොදු ජනයාට රැළි හා ප්‍රදර්ශක මගින් දැන්වීම
    - තොරතුරුමය ද්‍රව්‍ය සහිත කුටි
    - ආබාධිත ගැටලු පිළිබඳ රැස්වීම් හෝ සමුළු
- ආබාධ සහිත දරුවන් හා වැඩිහිටියන් සඳහා විනෝදාස්වාද
- අනාගත මුල පිරීම් පිළිබඳ සංවිධාන හෝ හා තනි පුද්ගල පාඨකයන් සමග කාලානුරූප රැස්වීම්
- ආබාධ සහිත පාඨකයන් සඳහා පුස්තකාලය, පරිගණක හා වෙනත් තාක්ෂණික උපාංග භාවිතය පිළිබඳ උපදෙස්
- සාකච්ජා කණ්ඩායම්
- ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති
- ඒකාබද්ධ මාධ්‍ය සම්බන්ධතා

## වැඩිදුර මූලාශ්‍ර

### ඉෆ්ලා නියමාවලි


Gyda Skat Nielsen & Birgitta Irvall, Guidelines for Library Services to Persons with Dyslexia (IFLA Professional Report # 70, 2001) http://www.ifla.org

Bror Tronbacke, Guidelines for Easy-to-Read Materials (IFLA Professional Report # 54, 1997) http://www.ifla.org

Nancy Mary Panella, Guidelines for Libraries Serving Hospital Patients and the Elderly and Disabled in Long-Term Care Facilities (IFLA Professional Report # 61, 2000) http://www.ifla.org


### ප්‍රයෝජනවත් වෙබ් ලිපින ඉංග්‍රීසියෙන් ඃ


http://www.w3c.org/WAI/

http://webxact.watchfire.com

http://www.rnib.org.uk/xpedio/groups/public/documents/publicwebsite/public_webaccessce ntre.hcsp

http://europa.eu.int/information_society/policy/accessibility/web/index_en.htm

http://www.ri.gov/acc_checklist.php

http://www.lgta.org/accessibility/

http://www.daisy.org

http://www.netserv.net.au/doonbank/access-htm

http://www.washington.edu/accessit/index.php